## විසර්ජන ශීර්ෂය - 265
## මන්නාරම- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා උප දිසාපති කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

* රජයේ කටයුතු සහ නීතියෙන් පැවරුන කාර්යයන්හි කාර්ය සාධනය නිලධාරීන් හා සංවිධාන මගින් ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය

* අමාත්‍යාංශ වල හා දෙපාර්තමේන්තු වල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

* ආදායම රැස්කිරීම.

* විමධ්‍යගත අයවැය වැඩ සටහන සහ වෙනත් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

* පළාතේ සභාවේ කටයුතු වලට සහ එහි විදේශීය මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහායවීම.

* රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා උප දිසාපති කාර්යාල

- මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- නානාටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- මුසලී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- මඩු උප දිසාපති කාර්යාලය
- මන්තායි බටහිර උප දිසාපති කාර්යාලය

## 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගිණුම් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 4. ගිණුම්

### මුළු ප්‍රතිපාදනය හා වියදම

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් හා උප දිසාපති කාර්යාල 2 ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.125,439,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.122,501,750 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ , ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ උප දිසාපති කාර්යාල වල ශුද්ධ ඉතිරි කිරීම් රු.2,937,250 ක් වු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 2.34 % ක විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 90,950,000 | 92,389,000 | 92,336,701 | 52,299 | 0.06 |
| මූලධන | 33,050,000 | 33,050,000 | 30,165,049 | 2,884,951 | 8.73 |
| | <u>124,000,000</u> | <u>125,439,900</u> | <u>122,501,750</u> | <u>3,773,083</u> | 2.34 |

### 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.650,717,163 ක් වු ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එම ප්‍රතපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය / අතිරික්තය (2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| 17 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 13,995,921 | 6,431,990 | 7,563,931 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 16,000 | 9,583 | 6,417 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 302,666,419 | 280,724,991 | 21,941,428 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 5,403,900 | 3,772,963 | 1,630,937 |

| | | | | |
|---|---|---|---|---|
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 138,500 | 64,222 | 74,238 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 7,042,870 | 6,996,724 | 46,146 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 133,735 | 104,260 | 29,475 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 9,813,760 | 8,333,402 | 1,480,358 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 5,538,226 | 5,448,188 | 90,038 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 95,045,186 | 82,555,188 | 12,489,304 |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 24,900 | 6,910 | 17,990 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 446,390 | 421,909 | 24,481 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 35,000 | 34,882 | 118 |
| 174 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 3,700,000 | 1,887,500 | 1,812,500 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 820,055 | 813,765 | 6,290 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 1,526,240 | 1,053,572 | 472,668 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 889,510 | 720,818 | 168,692 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 202,789,051 | 168,802,021 | 33,987,030 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 350,000 | 338,058 | 11,492 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 341,500 | 189,826 | 151,674 |
| | එකතුව | 650,717,163 | 568,710,772 | 82,005,207 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 01 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය**

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගණුම හා සැසඳුම් ප්‍රකාශ මෙම වාර්තාවේ (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.3 සිට 4.13 දක්වා වූ ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 265 | විසර්ජන ගිණුම | 2011 මාර්තු 30 |
| 26501 | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණම | 2011 මාර්තු 24 |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රීතී හා රෙගුලාසි වලට අනුකූලව මෙම ලේඛන පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පරිගණක , උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | |
| (ඈ) | පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | |

iii. පිළිවෙලින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ නිකුත් කරන ලද විගණන විමසුම් 5 කට හා 1 කට පිළිතුරු මෙම වාර්තාවේ දිනය දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අග්‍රිම ගිණුම

(i) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව කාර්යය නිමවී දින 15 සිට දින 131 ක් ප්‍රමාදවී උප අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මාණ්ඩලික ශ්‍රේණියේ නොවන ඇතැම් නිලධාරීන්ට අත්තිකාරම් ලබාදී තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවා පැවතුණු රු.7,365,877 ක් වූ තැන්පතු ශේෂයන් පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2010 දෙසැම්බර් 31 දිනට වූ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂ එකතුව රු.317,272 ක් වූ අතර එම හිඟ ශේෂයන් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමහර වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| i. | මෝටර් වාහන | 03 | වර්ෂ 03 |
| ii. | යන්ත්‍රෝපකරණ ( ජෙනරේටර් ) | 04 | වර්ෂ 04 |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

මුදල් රෙගුලාසි 756 හා 2010 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට සහ විගණකාධිපතිවරයාට වාර්තා කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 අප්‍රේල් 30 දක්වා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### (ඇ) බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.170,618 ක් වූ අතර එම බැරකම් වර්ෂයකට අඩු කාලයක් නිරවුල් නොකර පැවතුණි.

## 4.7 අවිධිමත් ගණුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ප්‍රසම්පාදන අත් පොතේ හා මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 වගන්තියට අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පත් කර නොතිබුණි. ඒ වෙනුවට ප්‍රාදේශීය ලේකම්වරු විසින් ප්‍රසම්පාදන කමිටු පත්කර තිබුණි.

(ආ) වඩා සුදුසු සැපයුම්කරු තෝරා ගැනීමේදී ප්‍රශස්ථ තීරණයක් ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට බොහෝ අවස්ථා වලදී නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) වාහනයක් ටින්කර් කර තීන්ත ආලේප කිරීම සඳහා රු.280,500 ක වියදම් දරා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ පරීක්ෂකගේ වැඩ නිම කිරීමේ සහතිකයට අනුව මෙම වාහනය 2011 මාර්තු 07 දින ගරාජයෙන් මුදාහැර තිබුණි. කෙසේ වුවද ඉහත කාර්යයන් නිම කිරීමට ප්‍රථම 2010 දෙසැම්බර් 31 දින සම්පූර්ණ ගෙවීම සිදුකර තිබුණි.

(ඇ) එන්ජින් කාමරය , ආරක්ෂක විශ්‍රාම කාමරය හා සුනඛයන් සඳහා කාමරයක් වෙනුවෙන් රු.385,863ක මුදලක් වැය කර තිබුණි. ලංසු ලියවිලි වලට සහ කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුමට අනුව එන්ජින් කාමරයක් ඉදිකිරීම සඳහා පමණක් සැලසුම් කර තිබුණි. එහෙත් එන්ජින් කාමරයට අමතරව ආරක්ෂක විශ්‍රාම කාමරය හා සුනඛයන් සඳහා කාමරයක් කිසිදු හේතුවක් නොමැතිව හා වාර්ෂික ඇස්තමේන්තු වල ප්‍රතිපාදන නොමැතිව ඉදිකර තිබුණු බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද ඉංජිනේරු ඇස්තමේන්තුව සැසඳීමේදී තථ්‍ය වියදම රු.117,461 කින් ඉක්මවා තිබුණි.

(ඉ) වී මිලදී ගැනීම සඳහා වූ රු.98,622 ක අත්තිකාරම් විධිමත් අනුමැතියක් නොමැතිව පානීය ජලය මිලදී ගැනීම සඳහා යොදා ගෙන තිබුණි.

(ඊ) ඉන්වොයිසි හා බිල්වල පිටපත් පදනම් කර ගෙන රු.253,942 ක මුදලක් ගෙවා තිබුණි.

(උ) 2010 දෙසැම්බර් 31 දින රු.40,460 ක මුදලක් ගෙවා තිබුණද , අදාළ බිල්පත්‍ර වල දිනයන් වූයේ 2011 ජනවාරි 07 , 10 සහ 17 දිනයන්ය.

## 4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ වල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයේදී අනාවරණය වූ තොරතුරු වලට අනුව එකතුව රු.1,745,645 ක් වූ චෙක්පත් නිකුත් කරන ලද නමුත් මාස 6 කට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 4.9 අනුකූල නොවීම්

### නීති , රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති , රීති , හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| <u>මුදල් රෙගුලාසි</u> | | |
| මු.රෙ.751 | වටිනාකම ගණනය කළ නොහැක | දෛනික ධාවන වාර්තා විධිමත්ව පවත්වා නොතිබුණි. |
| මු.රෙ.1645 | වටිනාකම ගණනය කළ නොහැක | ලැබුණු විෂයයන් 10 ක් ඉන්වෙන්ටරි ලේඛනයේ සටහන් කර නොතිබුණි. විෂයයන් 5 ක් නිකුත් කිරීම සඳහා නිකුත් කිරීමේ නියෝග පිළියෙල කර නොතිබුණි. |
| චක්‍රලේඛ විධිවිධාන | | |
| 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම දැක්විය නොහැක. | 2010 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 84,456 | මාරු කරන ලද නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන ජාතික අයවැය චක්‍රලේඛය | වටිනාකම දැක්විය නොහැක. | 2010 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. |
| ආයතන සංග්‍රහය | | |
| XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය | 71,303 | සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

* 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තියට පටහැනිව සැපයුම්කරුවන්ට ගෙවන ලද රු.280,500 ක් වු මුළු ගෙවීම් වලින් රු.2,275 ක් වූ 5% ක රඳවා ගැනීම් බදු (WHT) අයකර ගෙන නොතිබුණි.

### 4.10 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්ලවලතා

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වු ආරම්භ නොකර අතහැර දැමු ව්‍යාපෘති, නිම නොකර අතහැර දැමු ව්‍යාපෘති හා ව්‍යාපෘති ප්‍රමාද වු අවස්ථා පහත දැක්වේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ප්‍රමාදයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කිරීමට නියමිත දිනය | 2010 දෙසැ. 31 දක්වා වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| මන්තායි - දකුණ උප දිසාපති කාර්යාලයේ වැසිකිළි ඒකකය | 225,000 | 2010 ඔක්. 20 | 2010 දෙසැ. 31 | 212,079 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් හේතු ඉදිරිපත් කර නොතිබුණි. |
| උප දිසාපති කාර්යාලයේ පා පැදි හා වාහන නැවතුම් හල | 499,000 | 2010 ඔක්. 31 | 2010 දෙසැ. 31 | 456,656 | |
| උප දිසාපති නව නිල නිවාසය සඳහා එන්ජින් කාමරය | 440,000 | 2010 අගෝ. 31 | 2010 දෙසැ. 01 | 312,340 | |

### 4.11 පාඩු හා හානි

විගණන නියැදි පරීක්ෂණ වලදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබුණු තොරතුරු වලට අනුව වටිනාකම රු.2,760,000 ක් වු පාඩු හා හානි අනාවරණය විය.

## 4.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 19 | 13 |
| ii. | ද්විතීයික මට්ටම | 311 | 223 | 88 |
| iii. | ප්‍රාථමික මට්ටම | 51 | 36 | 15 |
| | එකතුව | 394 | 278 | 116 |

## 4.12 අභ්‍යන්තර පාලනය

**විගණන හා කළමනාකරණ කමිට ක්‍රියාත්මක කිරීම**

2000 මාර්තු 15 දිනැති අංක පීඑෆ් / පීඊ / 7 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වල දක්වා ඇති පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.